**කොවිඩ් 19 සති පාසල සබරගමු පළාත.**

නිවිතිගල අධ්‍යාපන කලාපය.

9 - ශ්‍රේණිය - - ඉතිහාසය -2021-පළමු වාරය

පැවරුම :- සතිය - 08 (2021- 02 - 22 සිට 2021- 02 - 28 දක්වා)

ඒකකය 02 :- ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය

ක්‍රියාකාරකම අංක 01 :- ඉංග්‍රීසීන් මුහුදුබඩ ප්‍රදේශ යටත් කර ගැනීම

පැවරුම් අංක 01 :- බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු සාධක සොයා බලමු.

හැඳින්වීම :- පෘතුගීසි හා ලන්දේසි යන බටහිර ජාතීන්ට පසුව ඉංග්‍රීසිහු ලංකාවට පැමිණියහ. ඉංග්‍රීසීන් විසින් 1796 දී මෙරට මුහුදුබඩ ප්‍රදේශ අල්ලාගැනීමෙන් පසුව 1815 දී සමස්ත දිවයින ම බ්‍රිතාන්‍යය යටත් විජිතයක් බවට පත් කර ගත්හ. එතැන් සිට 1948 පෙබරවාරි 04 දින මෙරටට නිදහස ලැබෙන තෙක් වසර 133ක පමණ කාලයක් මෙරට පාලනය ගෙන යන ලදී. එසේ බ්‍රිතාන්‍යයන් මෙරටට පැමිණීමත් මෙරට බලය තහවුරු කර ගැනීමත් පිළිබඳ මෙහිදී අවධානය යොමු කෙරේ.

සිසු උපදෙස් :-

*පියවර 01* පෙළ පොතෙහි පිටු අංක 21 - 25 දක්වා හොඳින් කියවා ගන්න.

*පියවර 02* ඉහතින් දී ඇති හැඳින්වීම, තේමාවට යටින් සටහන් කරගන්න.

*පියවර 03* පෙළ පොත කියවා පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

**<u>ප්‍රශ්නාවලිය</u>**

1) ඉංග්‍රීසීන්ගේ මව් රට නම් කරන්න.

2) බ්‍රිතාන්‍යයන් විසින් මෙරට කොතරම් කාලවකවානුවක් පාලනය කර තිබේද?

3) ඉංග්‍රීසීන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු සාධක තුන දක්වා ඒවාට උදාහරණ සපයන්න.

4) ප්‍රංශ ජාතිකයන්ට මෙන්ම ඉංග්‍රීසීන්ටත් එක හා සමාන වැදගත්කමක් සහිත වූ ලංකාවේ නැගෙනහිර වෙරළේ පිහිටි වරාය නම් කරන්න.

5) මෙරට පැවති වටිනාකමින් ඉහළ වෙළඳ ද්‍රව්‍ය පහක් නම් කරන්න.

6) උඩරට පාලකයින් ඉංග්‍රීසි සහය ලබා ගැනීමට යොමුවීමට බලපෑ සාධකය කුමක්ද?

පහත ප්‍රකාශයන්ට ගැලපෙන පිළිතුරු යා කරන්න.

| | | |
|---|---|---|
| 7) | ජෝන් පයිබස් කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමුවීම. | ක්‍රි.ව.1795 |
| 8) | රාජාධිරාජසිංහ රජු | රොබට් ඇන්ඩෘස් |
| 9) | රොබට් ඇන්ඩෘස් රාජාධිරාජසිංහ රජු | ක්‍රි.ව.1762 |
| 10) | ලන්දේසීන්ගේ බලකොටු යටත් කර ගැනීමට රාජාධිරාජසිංහ රජුගෙන් සහය පැතුවේ | කියුබොයිඩ් |

සැකසුම :- උදාර අරවින්ද
ර/ කලවාන ජාතික පාසල
නිවිතිගල අධ්‍යාපන කලාපය